මගේ අංකය: 5/5/2/04/2025
ආයතනික විභාග සංවිධාන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.
2026.08.

කතෝලික දහම් පාසල් ප්‍රධානීන් වෙත,

**කතෝලික ධර්මාචාර්ය සහතික පත්‍ර විභාගය - 2026**
**අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්**

2026 අගෝස්තු මස 14 වන දින රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමට නියමිත උක්ත විභාගයට අදාළ නිවේදනය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවන අතර, අයදුම්පත් සම්පූර්ණ කිරීමේදී පහත සඳහන් උපදෙස් අනුගමනය කරන මෙන් කාරුණිකව දන්වමි.

02. අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර, එහි දෙවන පිටුවේ මුද්‍රණය කර ඇති, ඊට අවශ්‍ය උපදෙස් ඉතා සැලකිල්ලෙන් කියවා අයදුම්පත සම්පූර්ණ කළ යුතු අතර, අයදුම්පතෙහි ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව ද තැබිය යුතුය.

03. අයදුම්පතේ 3.0 ශීර්ෂයේ දක්වා ඇති කොටුව තුළ විභාගයට ඉදිරිපත් වන මුළු අයදුම්කරුවන් සංඛ්‍යාව සඳහන් කළ යුතුය. 2.0 ශීර්ෂය යටතේ ඔබ දහම් පාසලට ලබා දී ඇති අංක 06කින් යුතු **පරිගණක අංකය** සටහන් කළ යුතුය. (මෙම අයදුම්පත් එවන ලද ලිපි කවරයේ අලවා ඇති ලිපිනයේ SCH No. යනුවෙන් සඳහන්ව ඇත්තේ එම අංකයයි.) දහම් පාසලට අදාළ කරුණු පිළිබඳව විමසීම් කිරීම සඳහා මෙම පරිගණක අංකය සටහන් කර තබා ගන්න.

04. බාහිර අයදුම්කරුවන්ට පෞද්ගලිකව විභාගයට ඉල්ලුම් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ. තම පදිංචි ස්ථානයට ආසන්නම දහම් පාසල මගින් අයදුම් කරන ලෙස ඔවුනට උපදෙස් දී ඇත. එබැවින් ඔබ ප්‍රදේශයේ යම් බාහිර අයදුම්කරුවකු පැමිණ මෙම විභාගයට ඉදිරිපත් වීමට අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලා සිටියහොත් ඔහුගේ/ ඇයගේ සුදුසුකම්, 2026 අගෝස්තු මස 14 දින පළ වූ ගැසට් නිවේදනයේ සඳහන් පරිදි සපුරා ඇති බව සනාථ කර ගෙන විභාග ගාස්තු අයකොට ඔබගේ දහම් පාසල මගින් ඉල්ලුම් කිරීමට අවස්ථාව සලසා දෙන ලෙස විශේෂයෙන් ඉල්ලා සිටිමි.

02. ප්‍රථම වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවෙන් නිදහස්ය. දෙවන වතාවට හෝ ඊට වැඩිවන වතාවකට හෝ පෙනී සිටින අයදුම්කරුවන් සහ සියලුම බාහිර අයදුම්කරුවන් රු. 200/-ක විභාග ගාස්තුවක් ගෙවිය යුතුය. අයදුම්පතේ සඳහන් විභාග ගාස්තු ගෙවිය යුතු වන අයදුම්කරුවන් සියලු දෙනාටම අදාළ මුළු මුදල, <u>විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 20-03-02-13 ට බැර වන ලෙස දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතෙහි පිටුපස ඇලවිය යුතුය. ලදුපතෙහි ඡායා පිටපතක් ලබා ගෙන එය සුරැකිව ඔබ වෙත තබා ගන්න. මුද්දර හෝ මුදල් ඇණවුම් මගින් විභාග ගාස්තු නොගෙවිය යුතුය.</u>

05. ඔබ දහම් පාසලෙන් සත්‍ය වශයෙන්ම ඉදිරිපත්වන අයදුම්කරුවන්ගේ නම් පමණක් සඳහන් කිරීමට කටයුතු කරන ලෙසත්, අයදුම්පත සම්පූර්ණ කරන විට තමන්ගේ සම්පූර්ණ නම හා අනෙකුත් විස්තර නිවැරදිව ඇතුළත් කර ඇති බව හොඳින් සනාථ කර ගත් පසුව අයදුම්පතේ තම අත්සන යෙදිය යුතු බවට අයදුම්කරුවන්ට උපදෙස් දීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

06. අයදුම්පත පිටපත් දෙකකින් සම්පූර්ණ කර, <u>මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල</u> යන ලිපිනය සඳහන් මේ සමඟ එවා ඇති කවරය තුළ බහා 2026 සැප්තැම්බර් මස 14 වන දිනට ප්‍රථම ලැබෙන සේ <u>ලියාපදිංචි තැපැලෙන්</u> එවිය යුතුය. <u>දෙවන පිටපත සුරැකිව තබා ගත යුතුය</u>. ප්‍රමාදව හා අසම්පූර්ණව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන බැවින් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

07. ප්‍රථම වතාවට ඉදිරිපත් වන දහම් පාසල් ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය සනාථ කිරීම සඳහා අදාළ ලේඛනවල සහතික කළ පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

සුජීව විජේරත්න
නියෝජ්‍ය විභාග කොමසාරිස් (සංවිධාන),
විභාග කොමසාරිස් ජනරාල් වෙනුවට